**<u>ජාතික ඉන්ධන බලපත්‍ර (National Fuel Pass) ක්‍රමවේදය සඳහා රාජ්‍ය සේවයට අදාල වාහන ඇතුළත් කිරීම සඳහා මග පෙන්වීමක්</u>**

1. රාජ්‍ය ආයතන සඳහා මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති වැය ශීර්ෂ පදනම් කරගෙන එක් එක් ආයතන සඳහා අනන්‍ය කේතයක් (BRN) ගොඩනඟා ගත යුතුය.
මෙහිදී දැනට වැය ශීර්ෂ ලබා දී ඇති ආයතන සඳහා එම අංකයම යොදා ගැනීමට යෝජනා කෙරේ
.

උදා:

| | | |
|---|---|---|
| උදා: | ජනාධිපති කාර්යාලය | : 001 |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය | : 264 |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය | : 111 |
| | බස්නාහිර පළාත් සභාව | : 312 |

2. වාහන රාශියක් ඇති රාජ්‍ය ආයතන බහුතරයක් සඳහා වැය ශීර්ෂ නොමැති බැවින් එම ආයතන සඳහා වැය ශීර්ෂය පදනම් කරගත් කේතයක් (BRN) ගොඩනඟා ගත යුතු වේ. ඒ සඳහා ඉංග්‍රීසි කැපිටල් අකුරු පද සහ ඉලක්කම් යොදා ගත හැකිය.

උදා:

1. ජාතික අධ්‍යාපන ආයතනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංකය වන 126 සහ National Institute of Education පදයේ වචනවල මුල් අකුරු පදනම් කරගෙන 126 / NIE යොදා ගත හැකිය. (මෙය යෝජනාවක් පමණි)

2. බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති මධ්‍යම රජයේ වැය ශීර්ෂ අංකයත්, දිස්ත්‍රික්කය හඳුනාගැනීමේ සංකේතයක් සහ ආයතනය හඳුනා ගැනීමේ සංකේතයක් යොදාගෙන 312/KAL/PDHS වැන්නක් යොදා ගත හැකිය. (මෙය යෝජනාවක් පමණි)

3. ඒ අනුව, දැනට මෙම කාර්යය සඳහා නිශ්චිත කේතයක් (BRN) නොමැති ආයතන සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් ප්‍රධාන ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ආයතන ප්‍රධානීන්ගේ මගපෙන්වීම යටතේ කේතයන් ගොඩනඟා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

4. ගොඩනඟා ගන්නා ලද කේතය (BRN) පද්ධතියට ඇතුළු කළ යුතු වන්නේ විධිමත් බලය පැවරුණු එක් එක් ආයතනයේ ප්‍රවාහන කටයුතු භාර නිලධාරියෙකු විසිනි.

5. මේ ආකාරයටම රාජ්‍ය අංශයට සෘජුවම සම්බන්ධ නොවන ආයතන (රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ ආයතන ආදී) සඳහාද කේතයන් (BRN) ගොඩනඟාගත හැකි වේ.

6. ජාතික ඉන්ධන බලපත්‍ර ක්‍රමවේදයේ මූලික අරමුණ දැනට පවතින සීමිත ඉන්ධන ප්‍රමාණය මනා කළමනාකරණයකින් යුතුව බෙදා හැරීමයි. ඒ අනුව ආයතනයන්ට දැනට මිලදී ගනු ලබන ඉන්ධන ප්‍රමාණය මුලුමනින්ම ලබාගැනීමට හැකියාවක් නොලැබෙනු ඇත. එමෙන්ම ආරම්භයේ දී මෙම ක්‍රමවේදය තුළ විවිධ ගැටලු ඇතිවීම ස්වභාවික වන අතර ක්‍රමානුකූලව එම ගැටලු විසඳාගෙන පවතින ඉන්ධන මනා කළමනාකරණයකින් යුතුව රාජ්‍ය ආයතන අතර බෙදා හැරීමට මෙම ක්‍රමවේදය ඉවහල් වනු ඇත. ඒ සඳහා සියලු දෙනාගේ උපරිම සහයෝගය උදක්ම අපේක්ෂා කෙරේ.